**පන්නල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**01.** **මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020මාර්තු 30දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජූලි 10 දින දවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020ජූලි 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------------------------------ | ------------------------- | ------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම් රු.163,804 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ආ) | 2018 වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තුව ඇස්තමේන්තුව රු.40,000,000 ක් වුවද රු.4,000,000 ක් ලෙස ගිණුම්වල දක්වා තිබීම නිවැරදි කිරීමේදී රු.36,000,000 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්වලට ගැලපිය යුතුවේ. | 2020 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම් ශේෂයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.923,073ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනයේ ශේෂ උපලේඛන සමඟ සැසඳී තිබිය යුතුවේ. | සේවක ණය<br>වෙනසට හේතු සොයා බලා රු.218,255.95 කින් වෙනස අඩුකර ගැනීමට හැකි වූ අතර ඉතිරි වෙනස සොයා ගැනීමට නොහැකි විය.මූල්‍ය ප්‍රකාශන හා උප ලේඛන අතර වෙනස දීර්ඝකාලයක සිට පැවත එන වෙනසක් බව ද දන්වා සිටිමි. |

## 1.4. අනුකූල නොවීම්

------------------

### 1.4.1. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| 218 රීතිය | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කර නොතිබුණු අතර උපලේඛන සහ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය අතර නොසැසදීම් තිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | මේ වනවිට අවසන් ගිණුමේ උපලේඛන හා ඉඩම් ලේඛන අතර නොසැසදීම් හදුනාගෙන ඇති අතර,2020 වර්ෂයේ අවසන් ගිණුමට හා උපලේඛනයට එම ඉඩම් ඇතුලත් කර නිවැරදි කිරීමට කටයුතු කරන බවත් ස්ථාවර වත්කම් (ඉඩම්) ලේඛනය යාවත්කාලීන කරන බවත් දන්වා සිටිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.91,103,432 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.89,654,732 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| i. වරිපනම් හා බදු | 14,747 | 14,359 | 13,232 | 3,043 | 10,254 | 9,820 | 8,277 | 2,245 |
| ii. බදු කුලී | 25,836 | 23,929 | 24,577 | 2,148 | 22,546 | 23,237 | 21,842 | 2,267 |
| iii. බලපත්‍ර ගාස්තු | 1,386 | 1,332 | 1,332 | - | 1,386 | 1,378 | 1,378 | - |
| iv. වෙනත් ආදායම් | 24,795 | 24,513 | 24,513 | - | 12,733 | 12,693 | 12,693 | - |
| එකතුව | 66,764 | 64,135 | 63,655 | 5,192 | 46,919 | 47,129 | 44,191 | 4,512 |

සටහන - 2019 වර්ෂය තුළදී රැස්කළ ආදායමින් රු. 3,970,617 ක් පෙර වර්ෂවල හිඟ ආදායම් වේ.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපකාර්යාලවල වසර 03 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට නොහැකිව පවතින වරිපනම් බදු රු.332,938 ක් හා අක්කර බදු රු.515,803 ක් විය. | ප්‍රාදේශීය සභා පනතේ ප්‍රතිපාදන හා රීති ප්‍රකාරවවරිපනම් හා බදු මුදල් රැස් කළ යුතුවේ. | 2020 වර්ෂය අවසන් වන විට මෙම හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 කුලී

---------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුලී ආදායම රු.2,148,906 ක් වූ අතර එයින් රු.1,440,363 ක මුදලක් 2020 මැයි මස අවසන් වන විට අයවීමට පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී මුදල් අයකරගත යුතුවේ. | 2020 මැයි මාසය අවසන් වන විට එම හිඟ මුදලින් රු.708,542 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟ මුදල්ද මෙම වසර අවසන් වන විට අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | උපකාර්යාල 03 ක 2008 වර්ෂයේ සිට 2018 දක්වා පැවති හිඟ මුදල් රු.451,645 ක් විය. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය අවසන් වන විට පැවති මෙම හිඟයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට 2019 වර්ෂයේ හිඟ මුදල්ද ඇතුළුව රු.2,244,896 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,876,123 ක් විය. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය අවසන් වන විට ලැබිය යුතු උසාවි දඩ මුදලින් රු. 8,551,125ක මුදලක් අයකර ගැනීමට ඇති අතර, මේ වන විට එම මුදල ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.81,585,143 ක් විය. | මුද්දර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් සකස් කර ගත යුතුවේ. | අදාල වර්ෂයේදීම එම මුදල් නොලැබෙන බැවින් පසුගිය වර්ෂවල මුදල්ද මෙම වර්ෂයේදී ලැබෙයි. එසේම 2018 හා 2019 වර්ෂ සඳහා රු.91,585,143ක් කුරුණෑගල හා කුලියාපිටිය රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබීමට පැවතුණි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කදානේ ගෙදර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 කින් රු.4,636,771 ක් හා වැටකෙයාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 කින් රු.220,332 ක් වන හිඟ කීමනී අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කීමනී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කදානෙගෙදර කඩ කාමර අංක 05 සඳහා රු.166,660 ක් ගෙවා ඇත. ඉදිරියේදී ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. වැටකෙයාව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02ක් සඳහාඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වැටකෙයාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් රු.444,450 ක කඩ කුලී අයකර ගැනීමට තිබුණ අතර අදාල ගිවිසුම අනුව මාස 03 කට වඩා හිඟ පවතින විට කඩ කාමර නැවත අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වැටකෙයාව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් අයවිය යුතු හිඟ කඩ කුලී මුදලින් මේ වන විට රු.377,850 ක මුදලක් අයකර ගෙන ඇත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව 36 ක් වූ අතර කාර්යාල කම්කරුවකුගේ අතිරික්තයක් පැවතුණි. | නියමිත පුරප්පාඩු පිරවීම හා අතිරික්තයන් අනුමත කර ගැනීම කළ යුතුවේ. | ඉදිරියේදී බඳවාගැනීම් කඩිනමින් සිදුකරන බවත් අනෙකුත් පුරප්පාඩු ද විධිමත් අනුමැතියෙන් අනතුරුව සම්පූර්ණ කරන බවත් දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි ක්‍රමානුකූලව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර උප කාර්යාලවල වත්කම් ප්‍රධාන කාර්යාලයේ වත්කම් ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | මේ වනවිට අවසන් ගිණුමේ උප ලේඛන හා ඉඩම් ලේඛන අතර නොසැසඳීම් හදුනාගෙන ඇති අතර 2020 වර්ෂයේ අවසන් ගිණුමට හා උපලේඛනයට එම ඉඩම් ඇතුලත් කර නිවැරදි කිරීමට කටයුතු කරන බවත් ස්ථාවර වත්කම් (ඉඩම්) ලේඛනය යාවත්කාලීන කරන බවත් දන්වා සිටිමි. |

### 3.3.2 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නිසාන් වර්ගයේ ආනයනික ගිනි නිවන රථය සභාව නමින් ලියාපදිංචි කිරීම හා වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදාගැනීමට ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නිෂ්කාර්ය වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම යන්ත්‍රය සභාව නමින් ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එය සභාව නමින් ලියාපදිංචි කිරීම සඳහා එම යන්ත්‍රයේ බර කිරා නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව පවතී. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | කදානේ ගෙදර වෙළඳ සංකීර්ණයට අයත් කඩ කාමරයක් සහ මාකඳුර වෙළඳ සංකීර්ණයට අයත් එක් කඩ කාමරයක් 2020 මැයි 22 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | කඩ කාමර වලින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර අංක 10 කීමනි මුදල් ගෙවීම ප්‍රමාද බැවින් කීමනි මුදල් සභා සතු කර ඉදිරියේදී වෙනත් අයෙකුට බදු ලබාදීමට කටයුතු සිදු කරමින් පවතී. කාමර 04 ගිවිසුම් අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇති නමුත් ගිවිසුම් අත්සන් කිරීමට නොපැමිණි බැවින් බදු කුලී අය නොකරයි. ඉදිරියේදී වෙනත් අයෙකුට බදු ලබාදීමට කටයුතු කරනු ලැබේ. |

**3.3.3 පවරානොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි 120 කින් 16 ක් පමණක් පවරා ගෙන තිබුණි. | පවරා ගැනීමට හා සභාව සතු දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුසාන භූමි 120 අතරින් 16 ක් පවරාගෙන ඇති අතර මැනුම් කර ඇති සුසාන භූමි 58 ක් සභාව වෙත පවරා දෙන ලෙස පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලුම් කර ඇත. ඉදිරියේදී සභාව විසින් ඉල්ලුම් කර ඇති සුසාන භූමි 58 සභාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදුවන බව දන්වමි. |
| (ආ) | සභාව භුක්ති විදින ඉඩම් 18 ක් පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |